# දඹුල්ල ප්‍රාදේශීය සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 සැප්තැම්බර් 30 දින වන විටත්, විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 23 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 05 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 ගනුදෙනු මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ආදායම් පරිපාලනය

උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 4,014,332 |
| (ii). | මුද්දර ගාස්තු | 1,453,800 |

#### 1.2.2 නිවාස කුලි

2009 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන හිඟ හිටි මුඩුක්කු සංහාරක නිවාස කුලී හා රජයේ නිවාස කුලී රු.98,164 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 1.2.3 ව්‍යාපාර බදු

1987 අංක 15ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති සංචාරක හෝටල් ආදායමෙන් 1% ක් නොඉක්මවන ව්‍යාපාර බද්දක් අයකරගත යුතු වුවත්, ඉකුත් වර්ෂය වෙනුවෙන් එවැනි හෝටල් 03 කින් ව්‍යාපාර බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.2.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

නිශ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවති වටිනාකම රු.92,580 ක්වූ භෞතික සම්පත් විෂයයන් 05 ක් හා වටිනාකම ගණනය කර නොතිබූ විෂයයන් 06ක් පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

1.2.5 හඳුනාගන්නා ලද පාඩු හා හානි

සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව, වටිනාකම රු.341,086 කවූ භාණ්ඩ අයිතම 33කට අදාළ ඒකක 366 ක්ද, වටිනාකම ගණනය කර නොතිබ භාණ්ඩ අයිතම 23 කට අදාළ ඒකක 57 ක් හා පුස්තකාල පොත් 823 ක ඌනතාවයක් අනාවරණය විය.

1.2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1) (1) වගන්තියට අනුව, පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලියවිල්ලකින් කලින් අනුමැතිය ලබා ගැනීමකින් තොරව සේවකයින් 17 දෙනෙකු ආදේශක පදනම මත බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු.2,481,283 ක වැටුප් සහා අරමුදලින් ගෙවා තිබුණි.

1.2.7 අවිධිමත් ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) පරිදි රු.100,000 කට වැඩි වාහන අලුත්වැඩියා සඳහා අමත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව අනමැතිය ලබාගත යුතු වුවත්, එවැනි අනුමැතියකින් තොරව අංක 252- 6503 දරන කැබ් රථය අලුත්වැඩියා කිරම පිණිස 2009 පෙබරවාර් 06 දින පුද්ගලික ගරාජයක් විසින් රු.210,716 ක ඇස්තමේන්තුවක් ලබාදී තිබුණි. එම අළුත්වැඩියා කටයුතු සඳහා වාහනය යොමු නොකිරීම හේතුවෙන් නැවත වරක් 2011 ජුලි 18 දින යථෝක්ත ගරාජය වෙත යොමු කිරීමේදී රු.2,068,408 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලදී. සභාවේ දුර්වල කළමනාකරණය හේතුවෙන් යථෝක්ත අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.1,875,692 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුව තිබුණි.

(ආ). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 හා 6.3 මාර්ගෝපදේශයේ උපදෙස් අනුව ලංසු කැඳවීමකින් තොරව HW -1745 දරන මෝටර් ග්‍රේඩරය අළුත්වැඩියාව හා ටයර් 06 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.790,936 ක මුදලක් ගෙවා තිබුණි. එකී මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) වගන්තිය පරිදි රු.100,000 කට වැඩි අලුත්වැඩියා වෙනුවෙන් අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොමැති අතර, අළුත්වැඩියා කටයුතු සතුටුදායකව කර ඇති බවට මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාවක් ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ). 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පීඑෆ් - 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව, රාජ්‍ය අංශයට අයත් සියලුම වාහනවල රක්ෂණ ආවරණ සෘජුවම ජාතික රක්ෂණ භාර අරමුදලෙන් හෝ සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතන් ලබාගත යුතු වුවත්, සභාව සතු වාහන 03 ක රක්ෂණාවරණය වෙනත් සමාගමකින් ලබා ගෙන සමාලෝචිත වර්ෂයෙදී හි රු.163,850 ක් ගෙවා තිබුණි.

(ඈ). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 හා 6.3 මාර්ගෝපදේශයන්ට අනුව, පොදු තරඟකාරී ලංසු ක්‍රමය හා ලියාපදිංචි තැපැල් මගින් මිල ගණන් කැඳවිය යුතු වුවත්, එසේ කිරීමකින් තොරව ව්‍යාජ ලෙස අත්මිල ගණන් 03 ක් ලබාගෙන කිසිදු ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව, සභා අනුමැතියකින්ද තොරව සභාපතිවරයාගේ නිල රාජකාරි ගමන් සඳහා පෞද්ගලික වාහනයක් යොදවා ගෙන තිබුණි. වාහනය රක්ෂණය කළ බවට හා හිමිකාරීත්වය තහවුරු කර ගැනීමට අදාල කිසිදු ලිපිලේඛනයක් ලබාගෙන නොතිබුණි. එසේම සභාපතිවරයාගේ ගමන් සඳහා මෙම වාහනය යොදවා ගත් බව තහවුරු කළ හැකි කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවූ අතර, 2011 අප්‍රේල් මස සිට 2012 ජුලි 18 දින දක්වා වාහන කුලී වශයෙන් රු.1,602,000ක මුදලක් ගෙවා තිබුණි. ගෙවීම සඳහා නිකුත් කළ චෙක්පත් වල රේඛනය අවලංගු කර නිකුත් කිරීමද විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.

(ඉ). අංක CPHW 1745 දරන මෝටර් ග්‍රේඩරය භාහිර ආයතන හා පුද්ගලයින් වෙත කුලියට දී තිබූණු අතර සමාලෝචිත වර්ෂයේ ජනවාරි 02 දින සිට දෙසැම්බර් 31 දින දක්වා එසේ කුලියට දීම වෙනුවෙන් පැය 319 ක් සඳහා ( එකතු කළ අගය මත බදු සහිතව ) රු.880,387ක කුලියක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. බොහෝ අවස්ථාවල පොදු අරමුදලින් කෙරෙන කර්මාන්ත සඳහා මෝටර් ගේඩරය යොදවා ගෙන තිබුණු අතර,අදාළ කොන්ත්‍රාත් සමිතිවල බිල්පත් පියවීමේදී ඒ සඳහා මෝටර් ග්‍රේඩරයට දරන ලද නඩත්තු පිරිවැය අඩුකර ගතයුතු වුවත්, එසේ අඩුකර ගැනීමෙන් තොරව බිල්පතෙහි සඳහන් මුළු මුදලම කොන්ත්‍රාත් සමිති වෙත ගෙවා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ viii වැනි පරිච්ඡේදයේ 4 ඡේදය ප්‍රකාරව මාණ්ඩලික නිලධාරියෙකු යටතට නොගැනෙන ආදායම් පරික්ෂකවරයාට 1/20 ක නිවාඩු දින වැටුප් දින 05 ක් සඳහා රු.4,280 ක් ගෙවා තිබුණි. එක් එක් දිනයන්හිදී ඉටුකළ රාජකාරිය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබියදි අවස්ථා 15 කදී තවත් නිලධාරීන් තිදෙනෙකුට නිවාඩු දින වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.47,480 ක් ගෙවා තිබුණි.

(උ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4,6.3 හා 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති මාලාවේ 207 හා 208 රීතිවලට අනුව, පොදු තරඟකාරී පදනමක් අනුගමනය කිරීමකින් තොරව අත්මිල ගණන් ලබාගෙන රු.156,265ක විදුලි උපකරණ මිළදී ගෙන තිබුණු අතර, එකී වටිනාකමින් රු.42,165ක වටිනාකමක් ඇති උපකරණ, තොග ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

1.2.8 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). රු.490,000 ක් වැයකර ඉදිකර තිබුණු නිකවටන ඇටවිරිය උල්පත අතුරුපාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ , විෂයය අංක B - 4 හි 265'x 0'x9'.0"x6"ප්‍රමාණයක් මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණත්, ඇස්තමේන්තු සංශෝධනය කිරීමක් හෝ සභාවේ අනුමැතියක් නොමැතිව 240'.3"x9'.0"x8" ප්‍රමාණයක් කොන්ක්‍රීට් කර තිබණි. මේ නිසා මාර්ගය ඇස්තමේන්තු ප්‍රකාරව අඩි 25' ක් ඉදිරියට ඉටු කිරීමට නොහැකි වී තිබුණි. එම වටිනාකම රු. 44,232 ක් විය.

(ආ). නිකවටන ඇටවිරිය උල්පත කෙසෙල්වත්ත පාර ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ ඝ.මී. 135.57 ක් බොරළු ඇතිරීම සඳහා රු.150,000ක් වැයකර තිබුණි. 2012 අගෝස්තු 22 දින කරන ලද භෞතික පරීක්ෂාවට අනුව, ඉටු කරන ලද වැඩ ප්‍රමාණය ඝ.මී.126.30 ක් වූයෙන් ඉටු නොකරන ලද ඝ.මී.9.27 ක් වෙනුවෙන් රු.11,960 ක් වැඩිපුර ගෙවා තිබුණ

(ඇ). ජාතික සවිය ගම නැගුම ප්‍රතිපාදන යටතේ වෙලන්ගොල්ල පුස්සැල්ල වැව් බැම්ම පුරවා සකස් කිරීමේ කර්මාන්තය සඳහා වෙලන්ගොල්ල සමෘධි බැංකු සංගමය වෙත රු.827,176 ක් සමාලෝචිත වර්ෂයන් හි ගෙවා තිබුණි. මෙම කර්මාන්තය සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් පිළියෙළ කර නොතිබුණු අතර, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ හෝ වගකිව යුතු ආයතනයක අනුමැතිය හෝ නිර්දේශ ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි. එසේම ඉදකිරීම ප්‍රදේශයේ ගොවි සංවිධානයකට පැවරිය යුතු වුවත්, සමෘද්ධි බැංකු සංගමයකට පවරා දී තිබුණි. ඇස්තමේන්තුව අනුව, වැව් බැම්ම මත බොරළු අතුරා ජලය යොදා හොඳින් තැලීමට ඇස්තමේන්තු කර ඇතත්, වැලි මිශ්‍රිත පස් යොදා හොඳින් තලා නොතිබුණු වැව් බැම්ම දෙපසට කඩා හැලෙමින් සෝදා පාලුවට ලක්වෙමින් තිබූ බව 2012 අගෝස්තු 23 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

මීටර් 400 ක් දුරට වැව් බැම්ම පිරවීම සඳහා ගෙවීම් කර තිබුණත්, භෞතික පරීක්ෂණයට අනුව, පස් පිරවූ කොටසේ දිග මීටර් 307 ක් බව නිරීක්ෂණය වූයෙන් ඝ.මී. 238 ක් වෙනුවෙන් රු. 135,898 ක් වැඩිපුර ගෙවා තිබුණි.

1.2.9 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ). 1988 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලපරිච්ජේදයට අයත්,සේවය හැරගිය හා මියගිය සේවකයින් 19 දෙනෙකුගෙන් අය නොවී පවතින රු.108,059 ක ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ). 2006 සිට 2009 දක්වා කාල පරිච්ජේදයට අදාළ රු.993,484 ක ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 571 (2) හා (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි

(ඇ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 (2) රෙගුලාසිය ප්‍රකාරව තත්ත්කාර්ය අතුරු අග්‍රිමයක් දෙනලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 08 කදී දෙනු ලැබූ රු.481,972 ක අත්තිකාරම් 2012 අගෝස්තු 22 වන විටත්, පියවා නොතිබුණි.

(ඈ). රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ස්ථිර නිලධාරීන් 07 දෙනෙකු සිටියදී චෙක්පත් ලිවීම, ගෙවීම් මුදල් පොත ලිවීම, වැය ලේඛන ලිවීම හා ගෙවු වවුචර් ගොනු පවත්වා ගෙන යාම ඇතුළුව ප්‍රධාන කාර්යයන් සභාවේ සෞඛ්‍ය කම්කරු සේවිකාවක වෙත පවරා තිබුණි.

2. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශෙෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). අභ්‍යන්තර පාලනය
(ආ). මූල්‍ය පාලනය
(ඇ). ගබඩා පාලනය
(ඈ). වත්කම් කළමනාකරණය
(ඉ). කොන්ත්‍රාත් පරිපාලනය
(ඊ). වාහන පාලනය